
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
(කැලණිය විශ්වවිද්‍යාලය)

# පැරණි ශ්‍රී ලාංකේය බෞද්ධ චිත්‍ර කලාවේ විශේෂ ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයක්

(අනුරාධපුර - පොළොන්නරු යුග ඇසුරිනි)



එන්.ටී.පී.ජී. මෝහාන් නන්දන
(ලියාපදිංචි අංකය : 2009/M.phil/2026

කැලණිය විශ්වවිද්‍යාලයීය
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ
දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන ස්වාධීන පර්යේෂණ නිබන්ධනය

2011

# හැඳින්වීම

පාසල් අවධියේ සිට ම ඓතිහාසික චිත්‍ර ශේෂ ව පවත්නා ස්ථාන සොයා බැලීමටත්, හැකි සෑම අවස්ථාවකදී ම ඒවා නැරඹීමටත්, ඒ සම්බන්ධයෙන් ලියා වී ඇති පොත් පත් කියවා බලා කරුණු සෙවීමටත් මා සිත යොමු විය. මෙම මාතෘකාව යටතේ පර්යේෂණයක් සිදු කිරීමට මා සිත යොමු වූයේ ඒ නිසා ය.

සෙනරත් පරණවිතාන, එච්.සී.පී. බෙල්, නන්දදේව විජේසේකර වැනි විද්වතුන් අනුරාධපුර හා පොළොන්නරු යුගවල චිත්‍ර කලාව පිළිබඳ ලිපි සම්පාදනය කර ඇතත් මෙම යුග දෙකෙහි පැරණි චිත්‍ර ගැන සම්පූර්ණ අවධානයක් සහිත පර්යේෂණ ග්‍රන්ථයක් මෙතෙක් පළ නොවීම බලවත් අඩුපාඩුවක් හෙයින් එම අඩු පාඩුව හැකි පමණ පිරිමසාලීමට මෙහි කරුණු දක්වා ඇත.

පළමුව ඓතිහාසික ලිපි ලේඛන, පුරා විද්‍යා පාලන වාර්තා, බෞද්ධ කලා ඉතිහාසය හා මේ හා සම්බන්ධ විවිධ විද්වතුන් විසින් සම්පාදනය කරන ලද පොත් පත්වලින් චිත්‍ර කලාව පිළිබඳ කරුණු එක් රැස් කළෙමි. අනතුරුව අනුරාධපුර හා පොළොන්නරු යුගවල චිත්‍ර ප්‍රායෝගික ලෙස ගවේෂණය කිරීමට හැකි සෑම විටම එහි ගියෙමි. චිත්‍ර කලාව සම්බන්ධයෙන් විස්තර දන්නා විවිධ තරාතිරම්වල පුද්ගලයින්ගෙන් ද මීට තොරතුරු දන ගතිමි. නොයෙක් හේතූන් නිසා කාලය සමග වැළලී ගිය ඉතිහාසය පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීමට වංශ කථා විස්තර, ශිලා ලේඛනම ය සාධක, සාහිත්‍ය මූලාශ්‍ර, ජනශ්‍රැති යන ආදීය මෙන් ම කලා ශිල්ප ද එක සේ වැදගත් විය. කලා ශිල්ප යටතට ගැනෙන චිත්‍ර කලාව එකසේ වැදගත් බව ඉතිහාසඥයින්ගේ මතය වී තිබේ. පැරණි චිත්‍ර මගින් එකළ සමාජය පිළිබඳව ද ඉතා වැදගත් තොරතුරු රාශියක් අනාවරණය කර ගත හැකි ය.

මෙහි ප්‍රධාන වශයෙන් ඓතිහාසික හා සාමාජීය වශයෙන් සළකා කරුණු ගොනු කිරීමට මම උත්සාහ කළෙමි. මෙමගින් එම චිත්‍ර අතිශය අනර්ග සටහන් බව තහවුරු වේ. මෙහිදී මා තහවුරු කිරීමට ප්‍රයත්න දරා ඇති පහත සඳහන් තොරතුරු ප්‍රකාශ කළ හැකි ය. බෞද්ධ චිත්‍ර කලා ඉතිහාසය චිත්‍ර කලා සම්ප්‍රදායන් දෙකක් එකිනෙකට සමාන්තර ව ගොඩනැගී ඇති බව සඳහන් කළ හැකි ය. මෙම සම්ප්‍රදායන් දෙක එකිනෙකින් සම්පූර්ණ වශයෙන් වෙනස් වන ලෙස විස්තර කළ නොහැකි වේ. එහෙත් ඉන්දීය ආභාෂයෙන් පණ ගැන්වුනු එක ම කලා නිපුණතාවයන් ප්‍රකාශ කෙරෙන චිත්‍ර ලෙස බෞද්ධ චිත්‍ර කලාව හැඳින්විය හැකි ය. යම් යුගයක චිත්‍ර නිර්මාණය කරණ චිත්‍ර ශිල්පියෙක් විෂය කර ගන්නේ සමකාලීන සමාජයෙහි දක්නට ලැබෙන්නා වූ වස්තූන්ගේ ආකෘති බව වියතුන්ගේ පොදු පිළි

ගැනීම වී ඇත. මේ පිළිබඳව ද මෙහිදී අවධානය යොමු කළෙමි.

අධ්‍යයනයේ පහසුව පිණිස පරිච්ඡේද හතරකට බෙදා දක්වමින් කරුණු ගොණු කිරීම සිදු කර ඇත. පළමු පරිච්ඡේදයෙන් පැරණි ශ්‍රී ලාංකේය බෞද්ධ චිත්‍ර කලාව පිහිටි ස්ථානවල ඉතිහාසය පිළිබඳව මූලාශ්‍රය ඇසුරින් කරුණු දක්වා ඇත. මෙහි දී විශේෂයෙන් ම එම ස්ථානයන්හි ඓතිහාසික පසුබිම, ශේෂ ව ඇති චිත්‍ර හා එම චිත්‍රවල කාල පරිච්ඡේදයන් පිළිබඳ පළ වී ඇති මත පිළිබඳව ද තොරතුරු සාකච්ඡා කෙරේ.

ශ්‍රී ලාංකේය බෞද්ධ චිත්‍ර කලාව උදෙසා බලපෑ භාරතීය ආභාෂය පිළිබඳ ව කරුණු ඉදිරිපත් කිරීම දෙවන පර්ච්ඡේදයෙන් සිදු වේ. මෙහිදී ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ඈත අතීතයේ සිට පැවති සම්බන්ධතා පිළිබඳ තොරතුරු අන්තර්ගත කොට ඇත.

තෙවන පර්ච්ඡේදය ශ්‍රී ලාංකේය බෞද්ධ චිත්‍ර කලා විෂයෙහි බලපෑ වස්තු විෂය පිළිබඳව ය. අනුරාධපුර හා පොළොන්නරු යුගවල චිත්‍ර ශිල්පීන් තම නිර්මාණ සඳහා උපයෝගී කොට ගෙන ඇති විවිධ තේමාවන් හා එමගින් නිරූපිත කරුණු පිළිබඳ ඉතා වටිනා තොරතුරු මේ යටතේ දක්වා තිබේ.

ශ්‍රී ලාංකේය බෞද්ධ චිත්‍ර කලාව මගින් අපේක්ෂිත අරමුණු පිළිබඳ ව හතරවන පරිච්ඡේදයේ දී සාකච්ඡා කෙරේ. විශේෂයෙන් ම සෞන්දර්ය රසාස්වාදනය පිළිබඳ ව බුදු දහමේ අන්තර්ගත කරුණු හා චිත්‍ර නිර්මාණය කිරීම මගින් බලාපොරොත්තු වූ අරමුණු මොනවා ද? යන්න පිළිබඳ ව එහිදී කරුණු දක්වා ඇත.

පස්වන පරිච්ඡේදයෙන් ශ්‍රී ලාංකේය බෞද්ධ චිත්‍ර කලාවේ ශිල්ප ක්‍රමය, උපයෝගී කර ගන්නා ලද වර්ණ හා ද්‍රව්‍ය, ශෛලීය හා කර්තෘවරු පිළිබඳ ව මෙන් ම එහි සාමාන්‍ය විපරිනාමය සම්බන්ධ විස්තර සාකච්ඡා කෙරේ.

ශ්‍රී ලාංකේය බෞද්ධ චිත්‍ර පිහිටි ස්ථාන වන සීගිරිය, හිඳගල, දිඹුලාගල, පුල්ලිගොඩ හා මාරවිදිය, අනුරාධපුර රුවන්වැලි මහා සෑයේ නැගෙනහිර වාහල්කඩ, පොළොන්නරුවේ උතුරු වෙහෙර හෙවත් තිවංක පිළිම ගෙය, ගල් විහාරය හා ලංකාතිලක විහාරය පිළිබඳව අගනා තොරතුරු රැසක් හයවන පරිච්ඡේදයෙන් විස්තර කොට තිබේ.

හත්වන පරිච්ඡේදයෙන් ශ්‍රී ලංකේය බෞද්ධ චිත්‍ර කලාවේ හා භාරතීය චිත්‍ර කලාවේ සම විෂමතා පිළිබඳ ව තුලනාත්මක ව කරුණු විග්‍රහ කර ඇත. එසේම, සමාලෝචනය හා නිගමනයත් අටවන පරිච්ඡේදයෙන් ඉදිරිපත්කොට තිබේ.

එමෙන් ම අනුරාධපුර හා පොළොන්නරු යුගවල චිත්‍ර කලාව පිහිටි ස්ථාන වලින් ලබා ගන්නා ලද ඡායාරූප හා මා විසින් ඒවා අධ්‍යයනය කිරීමෙන් පසුව අඳින ලද චිත්‍ර ද ඒ ඒ අවස්ථාවල දී මෙම නිබන්ධනයෙහි ඉදිරිපත් කර ඇත. මෙමගින් ශ්‍රී ලංකේය පැරණි බෞද්ධ චිත්‍ර කලාවේ විශේෂ ලක්‍ෂණ පිළිබඳ මෙතෙක් අනාවරණය නොවූ කරුණු රැසක් හෙළි දරව් වනු ඇතැයි යන්න මම බෙහෙවින් විශ්වාස කරමි.